**සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු තැගි අරමුදල - 2022**

---------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු තැගි අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1990 අංක 37 දරන සුරාබදු පනතින් සංශෝධිත 1912 අංක 08 දරන සුරාබදු ආඥාපනතේ 58 "ඒ" වගන්තිය හා සුරාබදු ආඥාපනතේ 32(2) (කිව) වගන්තිය යටතේ වූ අංක 818 සුරාබදු නිවේදනය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් ජංගම නොවන වත්කම් උපලේඛනයේ වත්කම් වලට අදාල සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු. 141,718,128 පිරිවැය වෙනුවට රු.63,033,460 ක ධාරණ අගයන් දක්වා තිබුණි. | වත්කම් භෞතිකව නිවැරදි ලෙස වෙන්කර හදුනා ගැනීමට අපහසු වී ඇති බවත් මෙහි ලේඛන ගත අගයක් පමණක් දිගු කලක සිට පවතින බවත් එ් හේතුවෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් නිවැරදිව හදුනාගෙන නොමැති බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල මිලදීගෙන තිබූ රු. 49,687,107 ක් වූ ජංගම නොවන වත්කම් හා රු.18,974,695 ක් වූ භාණ්ඩාගාරයේ තැන්පත් කරන ලද ක්ෂය සංචිත අරමුදලේ අවසාන ශේෂය පිළිවෙලින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ හා අවසාන මුදල් ශේෂය යටතේ දක්වා නොතිබුණි. | මුදල් ප්‍රවාහයේ මෙය පෙන්වීම අවශ්‍ය නොවන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයේ දී රු.500,000 වූ ඇප තැන්පතුවක් සමථ ආදායම් ලෙස ගිණුම්ගත වීමේ දෝෂය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය තුල නිවැරදි කර තිබුණ ද එය නැවත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ද නිරූපණය කර තිබුණි. | පෙර වර්ෂයේ රු. 500,000 ක් ඇප තැම්පත් වැරදීමකින් සමත මුදල් ලෙස ගිණුම් ගත කර තිබීම පෙර වර්ෂයේ ගැලපීම් යන තීරුව තුළ ගැලපීම් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව කටයුතු කල යුතුය. |
| (ඈ) | ප්‍රාදේශිය සුරාබදු කාර්යාල වලට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ මුදලින් ලැබී තිබුණු රු. 9,651,195 සමථ ගාස්තු හා රු. 960,400 ක් වූ සිගරට් දඩ ආදායම් මූල්‍ය ප්‍රකාශන වල ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | අදාළ මුදල් 2022.12.31 දිනට බැංකු ගත වී තිබුණ ද එම ආදායම්වලට අදාළ වාර්තා ප්‍රාදේශීය කාර්යාලවලින් ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමට තිබූ දුෂ්කරතා හේතුවෙන් ගිණුම්ගත කිරීමට අපහසු වී ඇත. | ගිණුම් කාලච්ඡේදයට අදාළ මුදලින් ලද සියළු ආදායම් හදුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලින් දැක්විය යුතුය. |
| (ඉ) | සුරාබදු දෙපාර්තමේන්තුවේ ඇප තැන්පත් ගිණුමේ මත්පැන් නිෂ්පාදනාගාර 04 ක් සහ ස්කාගාර එකකට අදාළ නිරවුල් නොවූ කාර්මික අපරාධ 17 ක් සඳහා රු. 8,200,000 ක් වූ කාර්මික අපරාධ වෙනුවෙන් වූ ඇප තැන්පත් අරමුදලේ ඇප තැන්පතු ලෙස දක්වා නොතිබුණි. | ඉදිරියේ දී සුරාබදු ආඥා පනත සංශෝධනය කිරීමෙන් පසු සුරාබදු තැගි අරමුදල සඳහා වෙනම ඇප තැම්පතු ගිණුමක් පවත්වාගෙන යාමට කටයුතු කරන බව | අරමුදලට අදාළ ඇප තැන්පතු හදුනාගෙන ගිණුම් තැබීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ඉකුත් වර්ෂයේ බැරකම් වෙන් කිරීමකින් තොරව ඉකුත් වර්ෂයට අදාලව ඍජු ග්‍රහණ සඳහා ගෙවීම් රු. 6,027,639 ක් සහ අනිකුත් කාර්ය මණ්ඩලය සඳහා දිරිදීමනා ගෙවීම් රු.153,640 ක් සමාලෝචිත වර්ෂයේ සමථ තැගි මුදල් ගෙවීම් තුල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ අවසාන ගිණුම් සැකසීමේ දී නිවැරදිව බැරකම් සටහන් කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී බැරකම් සඳහා ප්‍රතිපාදන සැලසිය යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 17 (අ) I හා II ඡේද | ලැබෙන සිගරට් දඩ මුදලින් සියයට 25 ක කොටසකින් දුම්කොළ තැගි අරමුදලක් පිහිටුවීමට කටයුතු සිදු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම එවැනි අරමුදලක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. මේ දක්වාම වාර්ෂිකව වෙන්කල රු.21,440,516 ක් වූ මුදල් අරමුදලට ගෙවිය යුතු මුදලක් ලෙස දිගුකාලීන බැරකම් යටතේ දක්වා තිබුණි. | අදාළ සංශෝධන සකස් කිරීම ආරම්භ කර ඇත. | 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ විධිවිධාන ප්‍රකාරව දුම්කොළ තැගි අරමුදලක් පිහිටුවීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 48,444,530 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 71,662,784 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 120,107,314 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමථ ගාස්තු හා සිගරට් දඩ ආදායම රු. 38,435,933 ක් හෙවත් සියයට 31.7 කින් වැඩිවීම හා තැගි මුදල් ගෙවීම්, ක්ෂයවීම් ඇතුළු වියදම් රු. 76,708,784 ක් හෙවත් සියයට 49 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක සුරාබදු තැගි අරමුදලේ මූල්‍ය ප්‍රතිඵල හා ඉන් ශුද්ධ වත්කම් වලට වූ බලපෑම පරීක්ෂාවේ දී 2019 සිට 2021 වර්ෂය දක්වා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් නිරීක්ෂණය වූ අතර ඒ හේතුවෙන් එම වර්ෂ වල ශුද්ධ වත්කම් ද ක්‍රමයෙන් සැලකිය යුතු පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය හේතුවෙන් ශුද්ධ වත්කම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 19.17 කින් වර්ධනය වී තිබුණි. | නිරීක්ෂණය නිවැරදි බවට අදහස් දක්වා ඇත. | මෙහෙයුම් කටයුතු වලින් අරමුදලේ ආදායම් තරකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක සුරාබදු තැගි අරමුදලේ ශුද්ධ මුදල් ප්‍රවාහ හා ඉන් භාණ්ඩාගාරයේ පැවති අරමුදලේ තැම්පත් ගිණුම් ශේෂ වලට සිදු වු බලපෑම පරීක්ෂාවේ දී 2018 වර්ෂයේ සිට 2021 දක්වා අරමුදලේ තැම්පත් ගිණුමේ ශේෂය ක්‍රමයෙන් සැලකිය යුතු ප්‍රමාණයකින් පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ දී ඉකුත් වර්ෂයට සාපේක්ෂව එය සියයට 34.96 වර්ධනයක් නිරීක්ෂණය විය. | නිරීක්ෂණය නිවැරදි බවට අදහස් දක්වා ඇත. | අරමුදලේ මුලා තත්ත්වය ආරක්ෂා කර ගැනීමට කටයුතු කල යුතුවේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 27 දිනැති සුරාබදු චක්‍රලේඛ අංක 10/2019 හි 02 ඡේදය පරිදි, දැනට පවතින 1994 මාර්තු 4 දිනැති සුරාබදු නිවේදන අංක 818 සංශෝධනය කිරිමට යටත්ව, 2019 මාර්තු මස සිට දෙපාර්තමේන්තුවේ සේවය කරන සියළුම නිළධාරීන්ට දිරිදිමනා ගෙවීමේ දී තැගි අරමුදලින් දායක වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුල දී රු. 54,243,053 ක් සහ පෙර වර්ෂ වල දිරි දීමනා සඳහා හිමිකම් නොපෑ නිළධාරින්ට අවස්ථා 17 ක දී ගෙවන ලද රු.1,133,785 ක මුදලක් ඇතුළුව රු.55,376,838 ක් සුරාබදු අරමුදලින් දිරිදීමනා ගෙවීම් සඳහා වැයකර තිබුණි. දෙපාර්තමේන්තුවේ සියළු කාර්ය මණ්ඩලය වෙත දිරි දීමනා ගෙවීම සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන සැලසෙන පරිදි අදාළ සුරාබදු නිවේදනයේ සංශෝධන කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වනවිට වසර 27 ක් ගතවී තිබුණ ද අවසන් වී නොතිබුණි. | 1994 මාර්තු 04 දිනැති 818 සුරාබදු නිවේදනය දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පුළුල් වීම සැළකිල්ලට ගෙන, වර්තමානයට ගැළපෙන අයුරින් 818 සුරාබදු නිවේදනය සංශෝධනය කර අනුමැතිය සඳහා 2021.03.03 දින මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව. | 1994 මාර්තු 04 දිනැති 818 සුරාබදු නිවේදනය සංශෝධනය කඩිනමින් නිමකර ගත යුතුය. |
| (ආ) | අංක 818 දරණ සුරාබදු නිවේදනය ප්‍රකාරව තැගි අරමුදලේ කාරක සභාවේ වර්තමාන කමිටු සාමාජිකයන් පත්කිරිම් සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර සමාලෝචිත වර්ෂය තුල එම කමිටුවේ අයවැය ලේඛනය, ක්‍රියාකාරි සැලැස්ම අනුව භෞතික හා මුලා ප්‍රගතිය, මූලා ,මෙහෙයුම් කටයුතු සමාලෝචන පරීක්ෂාව සඳහා පවත්වා තිබුණු රැස්වීම් වාර්තා විගණනයට ඉදිරිපත් නොවිණි. | අංක 818 සුරාබදු නිවේදනය ප්‍රකාරව තැගි අරමුදලේ කාරක සභාවේ කමිටු සාමාජිකයින් පත් කිරීම් සම්බන්ධ තොරතුරු 2023 වර්ෂයේ දී නියමිත පරිදි විගණනයට ඉදිරිපත් කරන බව | ක්‍රියාකාරි සැලැස්ම අනුව, මෙහෙයුම් කටයුතු, සමාලෝචනය කර කමිටු රැස්වීම් වාර්තා විගණනයට ඉදිරිපත් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1994 මාර්තු 04 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනයේ සඳහන් සුරාබදු තැගි අරමුදලේ පරමාර්ථයන් වලින් පුහුණු කිරීම් සහ අධ්‍යාපනික කර්තව්‍යන්, ක්‍රීඩා, විනෝද සහ සුභ සාධක වැඩසටහන්, ප්‍රසංශනීය වැඩ, නිර්භීත ක්‍රියා, විශේෂ රාජකාරීන් විශේෂ වැටලීම් යන අරමුණු සඳහා සමාලෝචිත වර්ෂයේ වෙන් කළ රු.4,000,000 න් කිසිදු කාර්යයක් ඉටු වී නොතිබුණි. | 2022 වර්ෂයේ සුරාබදු තැගි අරමුදලට ඇස්තමේන්තු කළ ආකාරයට ආදායම් නොලැබීම . | සුරාබදු තැගි අරමුදලේ පරමාර්ථ ඉටු කර ගැනීමට ප්‍රතිපාදන යොදාගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ග්‍රහණ සම්බන්ධ තොරතුරු අනුව 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ග්‍රහන ඉලක්ක ලබාදීම් වාර්ෂිකව ක්‍රමයෙන් අඩු වී තිබුණි. තවද ඉලක්ක ගත ග්‍රහනවලට සාපේක්ෂව සිදු කළ ග්‍රහන ප්‍රමාණය වැඩි වී තිබුණි. 2021 සහ සමාලෝචිත වර්ෂයේ මුලින් සැලසුම් කළ ඉලක්ක ගත ග්‍රහන සංඛ්‍යාව පිළිවෙලින් 857 කින් සහ 1,574 කින් අඩුකර ග්‍රහන ඉලක්ක සංශෝධනය වී තිබුණ ද එම වර්ෂ වල තත්‍ය ග්‍රහන සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වීමක් පෙන්නුම් කෙරිණි. එය 2021 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වැඩි වි තිබුණේ සියයට 1 කින් පමණක් බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේදී මෙන්ම 2020 හා 2021 වර්ෂවලදී ද රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හා ඉන්ධන අර්බුදය හා ආර්ථික අර්බුදය මත ඉලක්ක සංශෝධනය කර ඇත. | සුරා බදු පන තේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා වු ක්‍රියාකාරකම් ඉටුවන පරිදි ග්‍රහන ක්‍රියාත්මක කල යුතුය. |
| (ආ) | කාර්මික අපරාධ ග්‍රහන දඩ මුදල් විශ්ලේෂණය පරීක්ෂාවේ දී 2011 අගෝස්තු 11 දිනැති අංක 03/2011 දරන සුරාබදු චක්‍රලේඛය ප්‍රකාරව වර්ගීකරණ 09 ක් යටතේ වූ ප්‍රධාන ගණයේ කොන්දේසි කඩකිරීම් 25 හා සාමාන්‍ය ගණයේ වැරදි 35 ක් දක්වා තිබුණු අතර 2022 වර්ෂයට අදාලව විගණනයට ලද තොරතුරු අනුව කාර්මික අපරාධ ග්‍රහන 3,627 ක් ත්‍යාග මුදල් ගෙවීම් සඳහා පදනම් කර තිබුණි. ඉන් 2,572 ක් හෙවත් සියයට 71 ක ප්‍රතිශතයක් සාමාන්‍ය වැරදි සදහ වු දඩ නියෝජනය වු අතර ප්‍රධාන ගණයේ කොන්දේසි කඩකිරීම් සඳහා වු දඩ නියෝජනය වුයේ 1,055 ක් හෙවත් සියයට 29 ක ප්‍රතිශතයක් පමණක් බව නිරීක්ෂණය විය. | ගුණාත්මක වැටලීම්වල ප්‍රගතිය අඩු වී ඇතැයි නිරීක්ෂණය කළ හැකිය. | කාර්මික අපරාධ වැටලීම්වල ගුණාත්මක ප්‍රගතියක් ලගාකර ගැනීම කෙරෙහි අවධානය යොමුකල යුතුය. |

4. **අයවැය ලේඛනමය පාලනය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැයගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යා සැසඳීමේදී ආදායම් විෂයන් 02 ක සියයට 6 සිට සියයට 14 දක්වා සහ වියදම් විෂයන් 08 ක සියයට 10 සිට සියයට 452 දක්වා පරාසයක විචලතාවයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය. | 2022 වර්ෂයේ රට තුළ උද්ගත වූ වාතාවරණය මේ සදහා හේතු වීය. | අයවැය ලේඛනය ඵලදායි කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගත යුතුය. |